# 11 ශ්‍රේණිය

## කොවිඩ් 19- සති පාසල (හත්වන සතිය)

**විෂයය : -සිංහල භාෂාව හා සාහිත්‍ය (සාහිත්‍ය සංග්‍රහය)**

**පාඩම :- අපටත් වැසිකිලියක්**

01. වැසිකිලි භාවිතය පිළිබඳව එදා ගම්මුන් තුළ පැවති ආකල්ප ඉස්මතුවන අවස්ථා තුනක් උපුටා දක්වා ඒගැන කෙටි විමසීමක් කරන්න.

02. "අපටත් වැසිකිලියක්", කෙටි කථාව සඳහා කතුවරයා යොදාගත් භාෂාවේ විශේෂතා කීපයකි. ඒවා පහතින් දැක්වේ.

1.ගැමි බස් වහර යොදා ගැනීම.
2. ගැමි පරිසරයක් ගත් උපමා රූගත භාවිතය.
3.සාම්ප්‍රදායික යෙදුම් (රූඩ)භාවිතය
4.සජීවි සංවාද යොදාගැනීම

මේ එක් කරුණකට උදාහරණ 03බැගින් පාඩම ඇසුරින් උපුටා දක්වන්න.

03. මෙම කෙටි කථාවේ අරමුණු ඉස්මතු කිරීමට එහි එන චරිත දායක වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

**විෂයය : -විද්‍යාව**

ඒකකය - තාපය

1) පෙල පොතේ (11කොටස) 7පිටු 1 සිට 3 දක්වා කොටස හොඳින් කියවා අවබෝධ කර ගන්න. විවිධ උෂ්ණත්වමාන පිළිබඳ තොරතුරු එකතු කර ගන්න.

2) පිටු 3 සිට 5 දක්වා හොඳින් කියවා සෙල්සියස් සහ කෙල්වින් පරිමාන අතර සබදතාව අවබෝධ කර ගන්න. පෙල පොතේ 6 පිටුව 9.2 අභ්‍යාසය ගැටලු විසඳන්න.

3) පෙලපොත 6 සිට 9 දක්වා පිටු කියවා තාපධාරිතාව සහ විශිෂ්ඨ තාපධාරිතාව අර්ත දක්වන්න.

4) පෙල පොතේ පිටු 10 සිට 11 දක්වා හොඳින් කියවා තේරුම් ගෙන වස්තුවක් තාපය උරා ගැනීමේදී හෝ පිටකිරීමේදී හුවමාරු වූ තාප ප්‍රමාණය සෙවීමට සම්බන්ධතාවක් ගොඩ නගන්න.ඒ අසුරින් පෙලපොත 12 පිටුවේ 9.2 අභ්යයසය ගැටලු විසඳන්න.

5) පිටු 13 සිට 16 දක්වා කියවා හොඳින් අවබෝධ කර පහත වචන හා වාක්‍ය අර්ත දක්වන්න.

ද්‍රවාන්කය,හිමාන්කය,තාපාන්කය,ගුප්තතාපය,විලයනයේ විශිෂ්ඨ ගුප්ත තාපය ,වාශ්පීකරනයේ විශිෂ්ඨ ගුප්ත තාපය

6) පෙල පොත 18 පිටුව අභ්‍යාසය 1, 2, 4 සහ 5 ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

**Subject : ENGLISH**

**Write an essay on how I spent the period of covid – 19 at home use about 200 hundred words'**

**විෂයය : - ඉතිහාසය**

**ඒකකය :- 05**

ඉතිහාසය පොත 30-31 පිටු හොඳින් කියවන්න.ඊට අමතරව පොත්පත් කියවීම තුලින් ලබාගත් උපුටන හා තාර්කිකත්වය ප්‍රයෝජනය ගන්න.

පහත සඳහන් ක්‍රියාකාරකම් 02 සිදුකරන්න.


1. බ්‍රිතාන්‍ය පාලනය නිසා ලංකාවේ සිදුවූ සංස්කෘතික වෙනස්කම් විස්තර කරන්න.

2.බ්‍රි තාන්‍ය පාලනය නිසා ලාංකික සමාජයට හිමිවූ හිතකර ප්‍රතිඵල සහ අහිතකර ප්‍රතිඵල වෙන වෙනම වගුගත කරන්න.

**විෂයය : - ගණිතය**

# මධ්‍ය ලක්ෂ්‍ය ප්‍රමේයය - 2

## මධ්‍ය ලක්ෂ්‍ය ප්‍රමේයයේ විලෝමය





AB = 6cm, BC = 7cm CA = 8cm වන ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න. AB පාදයේ මධ්‍ය ලක්ෂ්‍ය X ලෙස ලකුණු කරන්න. X හරහා BC ට සමාන්තර රේඛාවක් අඳින්න. එය AC පාදය හමුවන ලක්ෂ්‍යය Y ලෙස නම් කරන්න.

- AY හා YC මැන එම පාද අතර ඇති සම්බන්ධය ලියන්න.

**ත්‍රිකෝණයක එක් පාදයක මධ්‍ය ලක්ෂ්‍යය හරහා තවත් පාදයකට සමාන්තරව අඳින රේඛාවෙන් ඉතිරි පාදය සමච්ඡේදනය වේ.**

ඉහත ක්‍රියාකාරකමෙන් මෙම ප්‍රමේයය තහවුරු වනු ඇත.

**උදාහරණ 1**





PQR ත්‍රිකෝණයේ PQ හි මධ්‍ය ලක්ෂ්‍යය S ද, PR හි මධ්‍ය ලක්ෂ්‍යය T ද වේ. X යනු QR මත පිහිටි ලක්ෂ්‍යකි. PX යාකර ඇත. PX හා ST පාද Y හිදි ඡේදනය වේ. PY = YX බව පෙන්වන්න.

PQR ත්‍රිකෝණයේ
PQ හි මධ්‍ය ලක්ෂ්‍යය S නිසාත්,
PR හි මධ්‍ය ලක්ෂ්‍යය T නිසාත්,
මධ්‍ය ලක්ෂ්‍ය ප්‍රමේයය අනුව
QR // ST වේ.
PQX ත්‍රිකෝණයේ
QR // ST නිසා
QX // SY වේ.
PQ හි මධ්‍ය ලක්ෂ්‍යය S නිසා,
මධ්‍ය ලක්ෂ්‍ය ප්‍රමේයය විලෝමය අනුව
PY = YX වේ.

**උදාහරණ 2**

KLM ත්‍රිකෝණයේ LM පාදයේ මධ්‍ය ලක්ෂ්‍යය X ද, KX පාදයේ මධ්‍ය ලක්ෂ්‍යය Y ද වේ. දික් කරන ලද LY පාදයට KM පාදය N හි දී හමු වේ. $KN = \frac{1}{3}KM$ බව පෙන්වන්න. (ඉඟිය: YN පාදයට සමාන්තරව X හරහා රේඛාවක් ඇඳ එය KM පාදය හමු වන ලක්ෂ්‍යය P ලෙස නම් කරන්න.)




KXP ත්‍රිකෝණයේ
YN // XP (නිර්මාණය) සහ Y, KX හි මධ්‍ය ලක්ෂ්‍යය නිසා
මධ්‍ය ලක්ෂ්‍ය ප්‍රමේයය විලෝමයෙන්
KN = NP ①
~~LNM ත්‍රිකෝණයේ~~
LN // XP (නිර්මාණය) සහ LM හි මධ්‍ය ලක්ෂ්‍යය X නිසා
මධ්‍ය ලක්ෂ්‍ය ප්‍රමේයය විලෝමයෙන්
NP = PM ②
① හා ② ~~අනුව, KN=NP=PM~~ වේ. එවිට 3KN = KM වේ.


ඉහත ගැටළු තේරුම් ගෙන පෙළ පොතේ මධ්‍ය ලක්ෂ්‍ය ප්‍රමේයය පාඩමේ 11-3 අභ්‍යාස සඳහා පිළිතුරු සපයන්න.

## ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය


**පැවරුම -viii**

ඍජු ප්‍රක්ෂේපණ රූප ඉංජිනේරුවන්ට,තාක්ෂණික ශිල්පීන්ට ගෘහ සැලසුම් ශිල්පීන්ට නිර්මාණකරුවන්ට අධ්‍යනය කිරීම ඉතා වැදගත් වේ.

1. ඍජු ප්‍රක්ෂේපණ පෙනුම් අදින ජාත්‍යන්තර ක්‍රම මොනවාද ? ඒ සඳහා වූ සංකේත මොනවාද ?




2. ඍජු ප්‍රක්ෂේපණ පෙනුම් ඇදීමේදී ඉදිරි පෙනුම පැති පෙනුම සැලැස්ම නිවැරදි ව ස්ථාන ගත කරීම වැදගත් වේ.ඉහත නිර්මාණ නිවැරදි ව අදින්න .ප්‍රථම කෝණ ක්‍රමය භාවිත කරන්න .




3.

ඉහත දැක්වෙන රූපය තෙවන කෝණ ක්‍රමය භාවිත කරමින් අදින්න .

(මිනුම් භාවිත කිරීම අවශ්‍ය නොවේ.)

**Subject - science**

**Unit – heat**

1. Read page numbers 1-3 in your text book (part II) and collect information about different types of thermometers.
2. Read page 4 & 5 and understand the relationship between Celsius and kelvin scale and do exercise in page 6.
3. Read page 8 and 9 carefully and define terms heat capacity and specific heat capacity.
4. Read page 10 & 11 carefully and build a relationship to explain the amount of heat released or absorbed by an object and do exercise in page 12.
5. Read page 13 – 16 and explain following terms. Melting point, freezing point, boiling point,latent heat, specific latent heat of fusion, specific latent heat of vaporization.
6. Answer questions 1,2,4 and 5 in page 29 and 30

**විෂයය :- බුද්ධ ධර්මය**

**ඒකකය** :- 10 පාඩම - බෞද්ධ අනන්‍යතාවය සුරකිමින් සහජීවනයෙන් ක්‍රියා කරමු.

පාඩම කියවා පිළිතුරු සපයන්න

1. ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති මෙරට සංස්කෘතිය මිහිඳු මහ රහතන් වහන්සේගේ ආගමනයෙන් පසුව බෞද්ධ සංස්කෘතික මුහුණුවරක් ගත්තේ කෙසේද?
2. සහජීවනය ඇති කරන බෞද්ධ ඉගැන්වීම් 03 ක් නම් කරන්න.
   I. මෙම ඉගැන්වීම් තුලින් සමාජ සහජීවනය ඇතිවන ආකාරය විස්තර කරන්න.
   II. අප රට තුල ශ්‍රී ලාංකිකයන් සහජීවනයෙන් යුතුව ක්‍රියා කරන අවස්ථා කීපයක් ලියන්න.

**විෂයය :-නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය.**

7 විකසනය

පෙළ පොත හොඳින් අධ්‍යයනය කරන්න.

1. පාදයක දිය සෙ.මී.3 ක් වූ ඝනකයක් අඳින්න. ඔබ අඳින ලද ඝනකයේ විකසනය ඇද දක්වන්න.
2. දිග හා පළල සෙ.මී.3 ක්ද උස සෙ.මී.2 ක්ද වූ ඝනකාභයේ විකසනය අඳින්න.
3. දිග හා පළල සෙ.මී.2 ක්ද උද සෙ.මී. 4 ක්ද වූ සමචතුරස්‍රාකාර ප්‍රිස්මයේ විකසනය අඳින්න.
4. දිග, පළල , උස පිළිවෙලින් සෙ.මී.2., සෙ.මී.1, සෙ.මී.3, ක් වූ සෘජුකෝණාස්‍රාකාර ප්‍රිස්මයේ විකසනය අඳින්න.

**විෂයය :- නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය**

ඒකකය:- 5. ජලනල හා උපාංග

1. ජල නල උපාංග හා උපකරණ නල පද්ධතියට එක්කිරීමේදී යොදාගන්නා ද්‍රව්‍ය වර්ග හා ඒවායේ කාර්යයන් පැහැදිලි කරන්න.
2. එක් නළයක් තවත් නළයකට සම්බන්ධ කිරීමේදී භාවිතා කරන උපාංග වල රූපසටහනක් ඇඳ ඒවා භාවිතා කරන අවස්ථාව ඉදිරියෙන් ලියන්න.
3. ජල සම්පාදන කටයුතු වලදී හා දියර කසල අපවහන කටයුතු වලදී බෝහෝ විට භාවිත කරන ජනප්‍රිය නළ වර්ගය කුමක්ද? එය ජනප්‍රිය වීමට හේත් මොනවාද?
4. පාද කපාටය යොදා ගන්නා අවස්ථාවක් හා බෝල කපාටය යොදා ගන්නා අවස්ථාවක් පිළිබඳ විස්තර කරන්න.

.

**විෂයය :- පෙරදිග සංගීතය**

1. සමග්‍රහ, අවග්‍රහ, විෂමග්‍රහ, යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
2. ඔබට ශ්‍රවණය වන ගීත ඇසුරෙන් ගීත 10 බැගින් තෝරා ගෙන සමග්‍රහ, අවග්‍රහ, විෂමග්‍රහ, ගීත වලට වෙන් කරන්න.
3. එම ගීතවල මුල් පාදය ප්‍රස්ථාර කිරීමට යොමුවන්න.

**විෂයය :- ශිල්ප කලා**

**ඒකකය: -** පළමු පිළිස්සීමට පෙර මැටි භාණ්ඩ අලංකරණ ක්‍රම.

11 ශ්‍රේණිය පෙළ පොතේ පිටු අංක 136-139දක්වා හොඳින් අධ්‍යයනයෙහි නිරත වීමෙන් පසු පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත වන්න.

1. සෙරමික් භාණ්ඩ අලංකරණය කරන අවස්ථා 3 කි.ඒ මොනවාද?
2. හම් පදම් අවස්ථාව යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
3. හම් පදම් අවස්ථාවේදී සෙරමික් භාණ්ඩ සඳහා භාවිත කරන අලංකරණ ක්‍රම නම් කරන්න.
4. ඉහත ඔබ නම් කළ අලංකරණ ක්‍රම වෙන් වෙන්ව පැහැදිලි කරන්න.
5. ඔබ නම් කළ එක් අලංකරණ ක්‍රමයක් භාවිතා කරමින් මාටි භාණ්ඩයක් අලංකාර කරන ආකාරය පියවර වශයෙන් ලියන්න.

**විෂයය :- ගෘහ ආර්ථික විද්‍යාව**

:- ගෘහ ආර්ථික විද්‍යාව

ඒකකය:- මුල් ළමාවියෙහි පසු වන ගැහැණු දරුවෙකු සුදුසු ඇඳුම් පන්නයක පතරොම නිර්මාණය කරයි.

ක්‍රියාකාරකම් සඳහා උපදෙස් :- පෙළ පොතේ 11 වන පාඩම කියවා රූපසටහන් හොඳින් නිරීක්ෂණය කරන්න.

1. ළමා ගවුම් මැසීමට යෝග්‍ය රෙදි වර්ග (තනි පැහැ /මුද්‍රිත ) රැස් කර මැහුම් පොතේ අලවන්න. (සෙ.මී.4*සෙ.මී.4 රෙදි නියැදි)
2. අවුරුදු 5 ට අඩු ගැහැණු දර්වන් ඇග ලන ඇඳුම් පන්න වල රූප සටහන් රැස් කර පන්න 5 ක් අලවන්න.
3. එම ඇඳුම් පන්න වල කර, අත, ඉදිරි පස අලංකාර කිරීම, සාය බන ආදියෙහි විවිධ මෝස්තර නිරීක්ෂණය කරන්න.
4. ඔබ ලත් අත්දැකීම් ඇසුරින් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| ළමා ගවුම මැසීමට යෝග්‍ය රෙදි වල ලක්ෂණ | ළමා ගවුමක තිබිය යුතු ලක්ෂණ | ළමා ගවුම් අලංකාර කර ඇති ක්‍රම |
|---|---|---|
| | | |

5. ළමා ගවුමක , කර පළල , උස, සායේ උස, අතේ දිග, ඉදිරිපස, පිටුපස මූට්ටු වන අරහිස, මිනුම් පටියක් තබා මැන ප්‍රමාන සෙ.මී. වලින් සටහන් කරන්න.

**විෂය :- කෘෂි හා ආහාර තාක්ෂණය**

ඒකකය:- ආහාර නරක්විම.

1. ආහාර විෂ වීම යනු අර්ථ දක්වන්න.
2. සමහර ආහාර වල ස්වභාවිකව ඇති විෂ වර්ග මඟින් ඇති වන විෂ වීම් මෙන්ම ආසාත්මික තාද දැක ගත හැක. මෙසේ විෂ විය හැකි ආහාර වර්ග නම් කරන්න.
3. ආහාර විෂවීම අවස්ථා සඳහා උදාහරණ 5 ක් ලියන්න.
4. ආහාරයට විෂ ද්‍රව්‍ය එකතු විය හැකි අවස්ථා සඳහන් කරන්න.
5. ආහාර විෂවීම සිදු වූ අවස්ථා වලදී දැකගත හැකි රෝග ලක්ෂණ මොනවාද? උදාහරණ 4 ක් ලියන්න.
6. අධි අවදානම් ආහාර යනු මොනවාද? උදාහරණ 4ක් ලියන්න.
7. ආහාර විෂවීම් වලක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

**විෂයය : -නාට්‍ය හා රංග කලාව**

1. නාට්‍ය සංගීතය අයත් වන්නේ කුමන අභිනයටද?
2. නාට්‍ය ගීත සහ සංවාද අයත් වන්නේ කුමන අභිනයටද?
3. විවිධ නාට්‍ය ගී ප්‍රභේද වලට අයත් නාට්‍ය පහක් නම් කර එකී නාට්‍යවල ඇතුලත් නාට්‍ය ගී පහක මුල් පද පේලිය ලියා දක්වන්න.

**විෂයය :- තොරතුරු සන්නිවේදන තාක්ෂණය**

**ඒකකය :-** අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල

අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල පාඩම පසුගිය සති තුන තුල ලබා දුන් පැවරුම් මගින් ඔබ විසින් ආවරණය කර ඇත.

නැවතත් පෙළ පොතේ අන්තර්ජාලය හා විද්‍යුත් තැපැල පාඩම කියවා ඒ ඇසුරින් අ.පො.ස. සාමාන්‍ය පෙළ තොරතුරු සන්නිවේදන තාක්ෂණය විෂය යටතේ පහත දැක්වෙන පසුගිය විභාග ගැටලු සඳහා පිළිතුරු සපයන්න.

| වර්ෂය | I පත්‍රය | II පත්‍රය |
|---|---|---|
| 2019 | 26, 27, 28 | 1 – (x)<br>2 – (iii) – (b), (e)<br>4 – (i) – (a), (b), (c), (d), (e), (f) |
| 2018 | 27, 28 | 1 –(vi), (vii)<br>3 - (ii) – (a), (b) |
| 2017 | 31, 32,33 | 1 –(vii)<br>6 - (ii) |
| 2016 | 8, 17, 22, 23, 24 | 1 -( iii ), (vii)<br>6 - (ii) – (a), (b), (c), (d) |
| 2015 | 12 | 5 - (ii) |

**විෂයය :- භූගෝල විද්‍යාව**

1. ග්‍රාමීය ප්‍රදේශයන්හී යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට මෑත කාලයේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති 02 නම් කරන්න.

2. එම වැඩසටහන් රටේ සංවර්ධනයට දායක වන ආකාරය නිදසුන් දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

3. අන්තර්ජාල සම්බන්ධතාවලින් අපට ලැබෙන

a.වාසි දෙකක්ද

b. අවාසි දෙකක් ද කෙටියෙන් පැහැදිලි කරන්න.

**විෂයය :-පුරවැසි අධ්‍යාපනය**

1. පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආයතන /දෙපාර්තමේන්තු කීපයක් සඳහන් කරන්න.

2. ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් කඩවූ විට ගතහැකි ක්‍රියාමාර්ග සඳහන් කරන්න.

3. නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම් 05 බැගින් ලියන්න.

**විෂයය :-චිත්‍ර**

1. සීගිරි චිත්‍රයක් හොඳින් අධ්‍යනය කරන්න.
   සැ.යු. සීගිරිය අයත් යුගය, කාලය, අනුග්‍රහය,හා චිත්‍ර ශෛලිය, භාවිතා කළ ශිල්ප ක්‍රම, කලාත්මක ලක්ෂණ, වර්ණ භාවිතය, රේඛාකරණය, භාව ප්‍රකාශයනය හා ඒ පිළිබඳ විවිධ මත ගැන කෙටි සටහනක් ලියන්න.

**විෂයය :- වානිජ්‍යය**

1. **ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල ක්රීමෙන් ඉටු කරගත හැකි අරමුණු මොනවාද?**
2. **ලාභ අරමුණු කර නොගත් සංවිධාන වල ඉපයීම් මාර්ග මොනවාද?**

**විෂයය :- නර්තනය**

**පාඩම :- බෙර සරඹ වාදනය කරමු**

01. සතර බීජාක්ෂර නම් කරන්න

02.බෙර සරඹ තාල තබා කියන්න.

03ඒවා ත්‍රිවිධ ලය අනුව තාල තබමින් කියන්න.

04.ගැට බෙරයක රූපසටහනක් ඇඳ කොටස් නම් කරන්න.

**විෂයය : - සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය**

**ඒකකය :- සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය**

11 ශ්‍රේණිය සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පෙළපොතෙහි 10 වෙනි පාඩම කියවා පිළිතුරු ලියන්න.

1- පාසලේ පැවැත්වෙන වාර්ෂික වැඩසටහන් අතර නිවාසාන්තර ක්‍රීඩා තරගයට වැදගත් ස්ථානයක් හිමි වේ.ප්‍රධාන අවස්ථා තුනක් යටතේ නිවාසාන්තර ක්‍රීඩා තරගය සංවිධානය කෙරේ.එනම්,

1පූර්ව දින සංවිධානය

2තරග දින සංවිධානය

3පසු සංවිධානය

ඉහත අවස්ථා වලදී සිදුකෙරෙන කාර්යයන් වෙන් වෙන්ව ගොණුකර දක්වන්න.

2-කිසියම් ක්‍රීඩාවකදී කණ්ඩායම් අතර හෝ පුද්ගලයන් අතර හෝ සම්මත නීති මාලාවකට අනුකූලව,ජයග්‍රාහකයන් තෝරා ගැනීමට පවත්වනු ලබන තරගමාලාව තරගාවලියක් නමින් හැදින්වේ .තරගාවලියකදී තරග සටහන් සැකසිය යුතුය.තරග සටහන් සකසන ආකාර කීපයකි.එනම්,

1පැරදි පිළිමලුන් පිටු දැකීමේ ක්‍රමය හෙවත් ඉවත ලෑමේ ක්‍රමය

2සාකල්‍ය ක්‍රමය

3මිශ්‍ර ක්‍රමය

4අභියෝග තරගාවලිය

ඉහත ක්‍රම අතරින් පැරදි පිළිමලුන් පිටුදැකීමේ ක්‍රමය හා සාකල්‍ය ක්‍රමය අතර වාසි හා අවාසි සාකච්ඡා කරන්න